**<u>යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම</u>**
**<u>(කෙඩෙට් නිලධාරි පාඨමාලාව - උපාධි)</u>**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ කෙඩෙට් නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී පුහුණු කරවනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ පුහුණුවීම් කාලසීමාව සාර්ථක ලෙස නිම කිරීමෙන් පසුව විසිර යනු ලබන කෙඩෙට් නිලධාරින්හට **හමුදා අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිරිනැමේ**. ඔවුන් **දෙවන ලුතිනන්** වන ආරම්භක නිලයේ අධිකාරියට පත්කොට යෝග්‍යතාවයන් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් ද අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. <u>මූලික සුදුසුකම්</u>:

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | විවාහක/අවිවාහක බව | : අවිවාහක. |
| ඇ. | වයස | : 2026 මාර්තු මස 31 දිනට වයස අවුරුදු 18 ත් 23 ත් අතර විය යුතුයි. |
| ඈ. | උස | : අඩි 5 යි අඟල් 6 ට (167.5cm) නොඅඩු විය යුතුයි. |
| ඉ. | බර | : කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතුයි. |
| ඊ. | පපුව | : අඟල් 32 ට නොඅඩු විය යුතුයි. |
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | : 6/6 විය යුතුය ( උපැස් සහ කාච රහිතව). |
| ඌ. | ශරීර ස්කන්ධ දර්ශකය | : 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතුය. |

4. <u>අධ්‍යාපන සුදුසුකම්</u>:

අ. අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයන් 03ක් සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ S), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය ‘‘Yes’’ ලෙස සඳහන්ව තිබීම.

සහ

ආ. අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් පහකට (05) සම්මාන සාමාර්ථ (C) සමග විෂයන් අටක් (08) සමත්වීම හා දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව හා සිංහල/දෙමළ විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level – 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි භාෂාව සඳහා උපාධි/ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය).

හෝ

ඇ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

ඇ. ඉහත සුදුසුකම් සපුරා ඇති හා 2025 වර්ෂයට අදාලව අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයවළුන්ටද මේ සඳහා අයදුම්කළ හැක.

**සැ:යු : 2025 වර්ෂයට අදාළ අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අයදුම්කරුවන් අවසාන සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට අ.පො.ස (උ/පෙළ) අධ්‍යාපන සුදුසුකම් ඉහත සඳහන් පරිදී සපුරා තිබීම අනිවාර්යය වේ.**

5. **වෙනත් සුදුසුකම්**. ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.